# නෝර්වේ යවන්න බැරි ද?

කොටි සංවිධානයට පහසුකම් සැලසීමට නෝර්වේ රාජ්‍යයට තවදුරටත් ඉඩකඩ ලැබෙන බව පැහැදිලි ය. ජනාධිපතිවරණයේ දී මහින්ද රාජපක්ෂ මහතාට හිතවත් වේදිකාවලින් නැගුණු ප්‍රධාන ඉල්ලීමක් වූයේ නෝර්වේ නියෝජිතයන් ආපසු යැවීම ය. එය සිංහලයන්ගෙන් බහුතරයේ මතය බවට ද සැකයක් තිබිය නො හැකි ය. එපමණක් නොව කොටි සංවිධානයට විරෝධය දක්වන ආනන්දසංගරී මහතා වැනි දෙමළ නායකයෝ ද නෝර්වේ රාජ්‍යය පහසුකම් සපයන්නාගේ භූමිකාවෙන් ඉවත්විය යුතු බව පවසති. රටේ ජනතාවගෙන් ඉතා විශාල ප්‍රමාණයක් නෝර්වේ ආපසු යැවීමට පක්ෂවෙති.

එසේ වුවත් නෝරවේ ආපසු යැවීම එතරම් පහසු නොවන බව මේ වන විට බොහෝ දෙනාට අවබෝධ විය යුතු ය. එයට හේතුව කුමක් ද? ඊනියා සටන් විරාම ගිවිසුම නැවතත් විමර්ශණයට ලක්කරන බව ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ප්‍රකාශකර ඇත. එමෙන් ම නිරීක්ෂක කමිටුවෙන් නෝර්වේ ඉවත්කිරීම ගැන ද කතාබහ පැවැත්වෙයි. එහෙත් නෝර්වේ රාජ්‍යය තවදුරටත් ඊනියා පහසුකම් සලසන්නා ලෙස කටයුතුකරනු ඇත. නව ආණ්ඩුව බලයට පත්වීමෙන් පසු ඉන්දියාව බලාගිය විදේශ ඇමති මංගල සමරවීර මහතාට නෝර්වේ ඉවත්කිරීම ගැන ඉන්දියානු ආණ්ඩුවෙන් යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැති බව පැහැදිලි ය.

අපේ රටවල දේශපාලනය හා නිදහස ගැන කතාකිරීමේ දී නව යටත්විජිතවාදය ආදී පද යොදාගනු ලැබෙයි. මෙයින් අදහස්කෙරෙන්නේ හතළිහේ දශකය අගභාගයේ දී ආසියාවේ රටවලට ද හැටේ දශකයේ දී අප්‍රිකාවේ රටවලට ද නිදහස ලැබුණ නමුත් දැන් වෙනත් ආකාරයකට යටත්විජිතවාදය නැවතත් ක්‍රියාත්මකවන බව ය. මේ මතය ගැටගසා ඇත්තේ ද බටහිර රටවල වෙසෙන බුද්ධිමතුන් බව අමතක නොකළ යුතු ය. එහෙත් මෙය අපට පිළිගත හැකි ද? බටහිර සමාජීය විද්‍යාඥයන්ට අද නව හෙවත් නව්‍ය හා පශ්චාත් යන වචන නොමැතිව සංකල්පයක් නිර්මාණයකිරීමට නො හැකි ය. අපට නම් ඒ පෙනේනේ බටහිර සමාජීය විද්‍යාවන්හි බංකොළොත්කමක් ලෙස ය.

නව්‍ය (නියෝ) හා පශ්චාත් (පෝස්ට්) ආදී වචනවලින් බටහිරයන්  බලාපොරොත්තුවන්නේ කලින් තිබූ යම් ප්‍රපංචයක් වෙනුවට වෙනත් ප්‍රපංචයක් ඇති වී තිබෙන බව පෙන්වීමට ය. එකල තිබූ යටත්විජිතවාදය නැති වී දැන් නව්‍ය යටත්විජිතවාදයක් නිර්මාණය වී ඇතැයි ඔවුහු කියති. එහෙත් සිදු වී ඇත්තේ ප්‍රපංචයක් නැති වී ඒ වෙනුවට වෙනත් ප්‍රපංචයක් ඇතිවීම නොව ඒ කලින් තිබූ ප්‍රපංචය ම වර්ධනය වීම ය. වර්ධනය හේතුවෙන් ද වෙනසක් ඇතිවන බව පැහැදිලි නමුත් ඒ නිසා අළුත් තත්ත්වයක් ඇති වී නැත. වෙනසක් වී ඇතී නමුත් වෙනස අළුත් වර්ගීකරණයකට තුඩු නො දෙයි. මෙය ඊනියා පශ්චාත් නූතනත්වය පිළිබඳව ද අදාළ වෙයි. ලියෝතාද් විද්වතා පෝස්ට් මොඩරන් කන්ඩිෂන් නමින් පොතක් ලියුවේ නූතනත්වය අවසන්යැයි කීම සඳහා ය. එහෙත් නූතනත්වය ලංකාවේ නොව ලොව කිසිම තැනක අවසන් වී නැත. ඒ බව අද ඊනියා පශ්චාත් නූතනවාදීන්ට ම වක්‍රව හෝ පිළිගැනීමට සිදු වී ඇත්නම් ඒ දෙවයේ සරදමකට වඩා ප්‍රවාද සම්බන්ධයෙන් වූ බංකොළොත්භාවය නිසා සිදුවන්නකි. පශ්චාත් නූතනත්වය යන්නෙන් කලින් නොතිබූ තත්ත්වයක් නැත්නම් ඒ පශ්චාත් යනුවෙන් හඳුන්වන්නේ ඇයි? එහි දී පශ්චාත් යන්නෙන් කියැවෙන්නේ කලින් තිබියේ ද නැති නොතිබියේ ද නැති තත්ත්වයක් යැයි කීමට උත්සාහකිරීම ද ඉහතකී බංකොළොත්බවෙහි ම ප්‍රතිඵලයකි.

හතළිස්අටේ අපේ රටේ ද ඒ ආසන්නයේ දී ආසියාවේ වෙනත් ඇතැම් රටවල ද සිදුවූයේ යම් ආකාරයක දේශපාලන නිදහසක් දිනාගැනීම ය. එහෙත් ඒ කිසිම අයුරකින් පූර්ණ නිදහසක් නො වී ය. ඉන්දියාව එකල ස්වරාජ්‍යය සඳහා දැවැන්ත අරගලයක නිරත වුව ද, භාරතීයයන් ස්වරාජ්‍යය යන්න තේරුම්ගෙන තිබුණේ යැයි කිවහැකි නො වෙයි. අපට ඒ ප්‍රශ්නයක් නොවූයේ එකල විසූ නායකයන්ට ස්වරාජ්‍යයක් අවශ්‍ය නොවූ බැවින් ය. පූර්ණ නිදහසක් ගැන කතාකළ ලංකා සමසමාජ පක්ෂයට ද තිබුණේ දේශපාලන නිදහස පිළිබඳ මාක්ස්වාදී සිහිනයක් පමණකි. පූර්ණ නිදහස ලැබෙන්නේ මාක්ස්වාදයෙන් ද නිදහස්වීමෙනි යන අදහස එකල තබා මෙකලවත් මාක්ස්වාදීන්ට ඇති නොවෙයි.

© Prof. Nalin De Silva

බටහිර නූතනත්වයේ ප්‍රතිඵලයක් ලෙස ඇති වී තිබෙන බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයට සංරචක තුනක් වෙයි. ඒ සංස්කෘතික, දේශපාලනික හා ආර්ථික යනුවෙනි. ඒ සංරචක අන්‍යොන්‍යව බහිෂ්කාර නො වෙයි. එනම් ඒ එකිනෙකින් මුළුමනින් ම වෙන් නො වෙයි. ඒ සංරචක එකිනෙක සමග බැඳී ඇත. පූර්ණ දේශපාලන නිදහසක් දිනාගත හැක්කේ සංස්කෘතිකව හා ආර්ථිකව ද නිදහස්වීමෙන් පමණකි. මෙයින් අදහස්කරන්නේ ඒ සංරචක තුනෙන් සෑමවිටකම එක් ප්‍රමාණයට නිදහස ලබාගත යුතු ය යන්න නො වෙයි. යම් අවස්ථාවක සංස්කෘතික ලෙසට වඩා දේශපාලනික ව නිදහසක් අත්කරගෙන තිබිය හැකි ය. එසේත් නැත්නම් ආර්ථික නිදහසට වඩා දේශපාලනික නිදහස වැඩිවිය හැකි ය.

හතළිස්අටේදී අපට යම් දේශපාලන නිදහසක් දුන්න ද බටහිරයෝ අප රටෙන්වත් ඉන්දියාවෙන්වත් ඉවත්වී නො ගියහ. ඒ සීමිත දේශපාලන නිදහස සමග යම් සංස්කෘතික නිදහසක් හා ආර්ථික නිදහසක් ද ලැබුණු බව සැබෑ ය. ඉන්දියාව අපට වඩා ඒ ඒ අංශවල නිදහස ලබාගත්තේ ය. එහෙත් අප කිසිම රටකට පූර්ණ නිදහසක් දිනාගැනීමට නො හැකිවිය. බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය ආධිපත්‍යය අප මත දිගින් දිගට ම පවත්වාගෙන යෑමට යොදාගන්නා ලද ප්‍රධාන ම සාධක වූයේ අධ්‍යාපනය හා බටහිර මතවාද ය. ඒ ජනතාව අතර ප්‍රචලිතකිරීම සඳහා පාසල්, විශ්වවිද්‍යාල හා ජනමාධ්‍ය විය. රටක අධ්‍යාපන මට්ටමේ සාමාන්‍යය උසස්වත් ම ඒ රටේ දීනත්වය ද වැඩිවිය. එයට හේතුව වූයේ අධ්‍යාපනය යනු නිරපේක්ෂ අධ්‍යාපනයක් නොව අවසානයේ දී බටහිර ආධිපත්‍යය තහවුරුකරන බටහිර අධ්‍යාපනයක් වීම ය.

අප රටේ මතවාද ආධිපත්‍යය දරන්නේ බටහිරයන් බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. සිංහලයන්ගෙන් ඉතා වැඩි පිරිසක් ඒකීය රාජ්‍යයකට පක්ෂ නමුත් ජනමාධ්‍යයෙහි හා විශ්වවිද්‍යාලවල ඉන්නා උගතුන්ගෙන් වැඩිදෙනකුගේ පක්ෂපාතීත්වය සන්ධීය රාජ්‍යයක් සඳහා ය. සන්ධීය රාජ්‍යයක් වෙනුවෙන් කතාකරන කසිකබල් උගතුන් සිතනු ඇත්තේ අනෙක් අය ඒකීය රාජ්‍යයකට පක්ෂපාත වනුයේ ඔවුන්ගේ නූගත්කම (සමාජයීය විද්‍යා පිළිබඳ) නිසා හෝ ජාතිවාදීත්වය හෝ අවස්ථාවාදීත්වය නිසා බව ය. එහෙත් ඊනියා උගතුන්ගේ දැනුම යනු බටහිරයන් අප මත බලහත්කාරයෙන් හෝ ප්‍රයෝගයෙන් හෝ අප මත පටවන දැනුම ය. ඒ නිල දැනුම් ආධිපත්‍යය පිළිබඳ සංවේදී නොවීමෙන් ම පෙන්නුම් කරන්නේ දීනත්වය ය. සන්ධීය රාජ්‍යයකට පක්ෂපාත අය සුළු පිරිසක් වුව ද ජනමාධ්‍යයෙහි වැඩි ඉඩක්, ප්‍රමුඛත්වයක් ලැබෙන්නේ ඒ අයට ය. එයට හේතුව ද නිල දැනුම් ආධිපත්‍යය ය. මේ දැනුම් ආධිපත්‍යය විසින් ජනතාවට බලපෑම් ඇතිකෙරෙයි. නෝර්වේ ජාතිකයන් ආපසු යැවීම යථාර්ථය නොවේ යැයි ඊනියා උගත්තු කියති. එහෙත් යථාර්ථය (හා අර කසිකබල් බොරු යථය) ද බටහිරයන් අප පෑගීමට යොදාගන්නා ආයුධයකි.

මෙරට බහුතරයට නෝර්වේ ඊනියා සාමදූතයන් මේ නත්තල් සමයෙහි දීම ආපසු යැවීමට අවශ්‍ය නමුත් බටහිරයන්ගේ හා ජපන් රජයේ බලපෑම හේතුකොටගෙන එසේ කිරීමට නොහැකි වී ඇත. අද ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට බටහිරයෝ විශාල බලපෑමක් කරති. ක්ලින්ටන් මෙහි ආවේ සුනාමි ප්‍රතිසංස්කරණ බැලීමට නොවන බව බොහෝ දෙනා නො අදහති. ක්ලින්ටන් ගොස් නොබෝ දිනකින් ම අකාෂි පැමිණියේ ය. ඔහුට කිලිනොච්චි යෑමට ද අවශ්‍ය විය. යම්කිසි හේතුවක් නිසා ඒ වැළැක්වීමට ආණ්ඩුව සමත්විය. නෝර්වේ හැරෙන්නට වෙනත් රටවල නියෝජිතයන්ට වන්නියට යෑමට අවසර නොදීමට රජය තීරණය කර ඇත.

මහින්ද රාජපක්ෂ මහතාට අවශ්‍ය වුවත් නෝර්වේ ඊනියා සාමදූතයන් ආපසු යැවීමට ආණ්ඩුවට නොහැකි බව පැහැදිළි ය. එයට හේතුව ජනතාව තවමත් ඒ සඳහා සූදානමක් නැතිවීම ය. නැතහොත් ඒකාධිපතියකු හෝ ලෙස ක්‍රියාකර නෝර්වේ ජාතිකයන් ආපසු යැවීමට සමත් නායකයකු නැතිවීම ය. පසුගිය ජනාධිපතිවරණයේ දී මෙරට ජනතාව හාල්මැස්සන් දේශීය පණහට හා පරිප්පු පන්සීයට යටනොවී රටේ ඒකීයත්වය රැකගැනීමට ඉදිරිපත්වූහ. ඒ ඉතා ඉදිරි පියවරකි. එහෙත් ප්‍රශ්නය වනුයේ බටහිර ඊනියා ආධාරවලට ලෝබ නොවී හා ඔවුන්ගේ ආර්ථික තහංචිවලට යටනොවී රටේ ඒකීයත්වය රැකගැනීමට ජනතාව ඉදිරිපත්වන්නේ ද යන්න ය. මෙරට සිටින දීන උගතුන් මගින් අපට පැටවීමට තැත්කරන මතවාද නම් පරාජයකිරීම මහා කටයුත්තක් නො වෙයි. දැනටමත් ඒ සිදු වී ඇත. එහෙත් ආර්ථික සංරචකය තවමත් අපට එරෙහිව යයි. ඒ අතර සංස්කෘතිකව ද ජනමාධ්‍යය ඔස්සේ ඉන්ද්‍රිය පිනවීමට මුල්තැන දෙමින් (හැඟීම්වලට යටවීම වර්ධනයකරමින්) බටහිරයෝ අප පෙළති. නෝර්වේ ජාතිකයන් ආපසු යැවීමට එකා මෙන් ව කටයුතු කළයුතුවෙයි. ඒ සඳහා හාල්මැස්සන් දේශීය පණහට නොව ඊනියා ආධාර වශයෙන් ලැබෙන ඩොලර් කෝටි ප්‍රකෝටියකටවත් යට නොවී රටෙහි ඒකීයභාවය රැකගැනීමට අප ඉටාගත යුතු ය.

© Prof. Nalin De Silva